**ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ විගණන මතය

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය

පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු සංඛ්‍යා භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශවල සංඛ්‍යා පදනම් කර ගෙන පිළියෙල කළ යුතු වුවත්, පහත සඳහන් අවස්ථාවලදී එසේ කර නොතිබුණි.<br><br>(i) භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ලැබීම් රු.57,032,719 ක් වී තිබුණත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.17,178,885 ක් වැඩියෙන් රු.74,211,604 ක් ලෙස දක්වා තිබුණි.<br>(ii) භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ගෙවීම් රු.70,671,643 ක් වී තිබුණත් , මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.32,731,198 ක් වැඩියෙන් රු.103,402,841 ක් ලෙස දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 31 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම | පිළිගනිමි |
| (ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ප්‍රධාන ලෙජර වියදම් ලෙස ආදායමෙන් ආපසු | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව | පිළිගනිමි |

| | |
|---|---|
| ලැබීම් රු.45,422,897 ක් හා අග්‍රිම ලෙස රු.1,044,423 ක් දක්වා තිබුණත්, එකී සටහන් ඉහත සඳහන් රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූල වී නොතිබුණි. | ගිණුම් ගත කල යුතු වීම |

**1.6.2** **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් ප්‍රධාන ලෙජර ශේෂය සමඟ එකඟවන පරිදි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දැක්විය යුතුව තිබුණද, ප්‍රධාන ලෙජර ගිණුම අනුව මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.1,361,235,202 ක් වී තිබුණත් එය රු.80,164,862 ක් අඩුවෙන් රු.1,281,070,340 ක් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | පිළිගනිමි |

1.6.3 **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ භෞතික වත්කම් විකිණීමෙන් ලද රු.177,307 ක් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ සටහන් නොකර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවීම. | පිළිගනිමි |
| (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් යටතේ රු.32,813,169 ක ණය වාරික ලැබීම් හා රු.57,214,426 ක ණය ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයට ඇතුළත් වන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | පිළිගනිමි |
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී භෞතික වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා | - ඉහත පරිදි - | පිළිගනිමි |

වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් යටතේ වූ රු.130,116,088 ක වියදම්, ආයෝජන ක්‍රියාකාරකම්වල වැය කළ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබුණි.

1.6.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2010 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | පනතේ 34 වගන්තිය ප්‍රකාරව කුඹුරු ඉඩම් කෘෂිකාර්මික වගා හැර වෙනත් කාර්යයන් සඳහා භාවිතා නොකළ යුතුව තිබුණත්, කුඹුරු ඉඩමක් ගොඩකර මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මඩුල්බෝව ක්‍රීඩා පිටිය ඉදිකරමින් පැවතුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | මෙම ක්‍රීඩා පිටිය නව ක්‍රීඩා පිටියක් නොවන අතර වෙන් වූ ප්‍රතිපාදන යොදවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ බවත් එය කුඹුරු ඉඩමක පිහිටා ඇත්නම් එය ගොඩ ඉඩමක් සේ සලකා කටයුතු කිරිමට අවශ්‍ය අවසරය ගොවිජන සේවා සහකාර කොමසාරිස් මඟින් ලබාගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින බව දන්වා ඇත. |

1.6.5 **බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියාකළ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොන්ත්‍රාත්කරුවන් සක්‍රිය බදුකරුවන් බව සනාථ කෙරෙන නිෂ්කාශන සහතිකයක් දේශීය ආදායම් දෙපාර්තාමේන්තුවෙන් ලබා නොගෙන එකතුව රු.මිලියන | එකතු කළ අගය මත බදු ගෙවීමට ප්‍රථම සක්‍රීය බදුකරුවෙකු බව සනාථ කර ගැනීමට නිෂ්කාශන සහතික | මෙම වසරේ සිට එවැනි තහවුරුවක් (ඉතා ආසන්න කාලයක ලබාගත්) අනිවාර්යයෙන් ලබා ගත යුතු බවට අදාළ විෂයභාර නිලධාරීන් දැනුවත් කරන ලද අතර 2018 වසරේ ගෙවීම් |

| | | |
|---|---|---|
| 3.67 ක එකතු කළ අගය මත බදු මුදල් කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු වෙත ගෙවා තිබුණි. | ලබාගත යුතු වීම. | සම්බන්ධයෙන් තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවීමට අවශ්‍ය වාර්තා පිළියෙල කරමින් පවතී. |

### 1.6.6 **අවිධිමත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාගම්මන වංගුව කඩේ මාර්ගය කොන්ක්‍රීට් කිරිම සඳහා රු.මිලියන 1.48 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වුවද ප්‍රතිපාදන සලසන ලද මාර්ගය වෙනුවෙන් සකස් කරන ලද ඇස්තමේන්තුව හා ගිවිසුම වෙනත් මාර්ගයක් කොන්ක්‍රීට් කිරීම සඳහා භාවිතා කර තිබුණි. මේ හේතුවෙන් අදාළ මාර්ගයේ ඉදිකිරීම් භෞතිකව පරීක්ෂා කළ නොහැකි විය. | විධිමත් පරිදි අනුමත කළ සැලැසුම් වෙනස් කිරීම අදාළ බල අධිකාරිය අනුව සිදුකළ යුතු වීම. | ඉහත මාර්ගයන් දෙක මාගම්මන වංගුව කඩේ මාර්ගය හා මාගම්මන වංගුව කඩේ අසලින් එගොඩ ගම්මැද්දට යන පාර වශයෙන් හඳුනාගත හැක. මෙය අනුමත ව්‍යාපෘති 2 ක් වෙනුවෙන් වෙන් වෙන්ව සකස් කළ ඇස්තමේන්තු 2කට අනුව වෙන් වෙන්ව එළඹුණු ගිවිසුම් 2 කට අනුව ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 2 ක් බව දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත.<br>මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා මණ්ඩලයක් පත්කරන ලද අතර, අදාළ වාර්තාව ලැබීමෙන් පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. |

**(ආ) අනුමත නොකළ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **(i)** අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රුවන්වැල්ල සංස්කෘතික මධ්‍යස්ථානයේ උඩුමහලේ සංවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ග්‍රාම සංවර්ධන සමිතියක් සමඟ | එළඹ තිබුණු ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුව භාර ගැනිමට කටයුතු කළ යුතු වීම හා ඊට පටහැනිව කටයුතු කර ඇති විට ගෙවීම | ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කිරීමේදී ව්‍යාපෘතියට අදාළ වැරදිමක් සිදුවුවහොත් නොපමාව නිවැරදි කිරීමට කටයුතු කරන ලෙසත්, ගිවිසුම්ගත |

| | | | |
|---|---|---|---|
| | රු.850,230 කට ඇස්තුමේන්තුගත ගිවිසුමකට එළඹ තිබුණි. එම ඉදිකිරීම් කටයුතු භෞතිකව පරීක්ෂාවේදී උඩුමහල සංවර්ධනය වෙනුවට මධ්‍යස්ථානයට යාබදව කාමර කොටසක් පමණක් ඉදිකර තිබුණි. ඒ සඳහා රු.825,466 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | නොකළ යුතු වීම, එසේ ගෙවීම් කර ඇත්නම් අදාළ පාර්ශවයන්ගෙන් එම මුදල් අයකර ගත යුතු වීම. | වීමේදී නිවැරදි නාමය සටහන් කරන ලෙසත් ප්‍රාදේශීය ලේකම්ට උපදෙස් දුනිමි. |
| **(ii)** | අපනයන කෘෂි ක්ෂේත්‍රයේ නියුතු තැනැත්තන්ගේ ජීවනෝපාය නගා සිටුවීම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැඩසටහන යටතේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇපලපිටිය නිවාස 40 අලුත්වලව්ව පාර සංවර්ධනය කිරීම සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම මාර්ගය අපනයන භෝග ආශ්‍රිත ආපදාවට ලක් නොවූ පෞද්ගලික ඉඩම් හිමියන් දෙදෙනෙකුට අයත් මාර්ගයක් බව ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය. මේ අනුව සංවර්ධන වැඩසටහනේ අරමුණු ඉටු වී නොතිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි සංවර්ධන කටයුතු ඉටුකළ යුතු වීම. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 23 වන වගන්තිය අනුව “ යම් ප්‍රඥප්තියක් ප්‍රකාර දැනටමත් පැවරී ඇත්නම් හැර ප්‍රධාන මංමාවත් නොවන යම් ප්‍රදේශයක් තුළ පිහිටා ඇති වෙනත් සියළු මංමාවත් ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව සතුවී ඇති බව සලකනු ලැබිය යුතුය. ” ලෙසින් සඳහන් වේ. ඒ අනුව ලියාපදිංචි නොවූවද, එම මාර්ගය ප්‍රාදේශීය සභාව සතු මාර්ගයකි. එමෙන්ම එම මාර්ගය පවුල් 11 ක් සඳහා ඍජුවම ප්‍රවේශ පහසුකම් සපයයි. මෙම ව්‍යාපෘති යෝජනාව මහජන නියෝජිතයින් විසින් ඉදිරිපත් කර අනුමත කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී වෙනත් අමාත්‍යාංශ 25 ක් හා දෙපාර්තමේන්තු 14 ක් වෙතින් සංවර්ධන ව්‍යාපෘති ඉටුකිරීමට හා ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම සඳහා පිළිවෙලින් රු.මිලියන | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ඉටුකිරීමට යෝජනා කරන ව්‍යාපෘති කල්වේලා ඇතිව ලබාගෙන එම ව්‍යාපෘති | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හා නියමිත වේලාවට අක්මුදල් නොලැබීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

| | | |
|---|---|---|
| 8,395.19 ක් හා රු.මිලියන 29.09 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් පිළිවෙලින් රු මිලියන 5,620.86 ක් හා රු.මිලියන 2.38 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමකින් තොරව ඉතිරි කර තිබුණි. එය ව්‍යාපෘති සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 0.4 ක සිට සියයට 91.7 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි | ඉටුකිරිමට සැලැසුම් කළ යුතුවීම. | |

**2.2 තැන්පත් ශේෂයන්**

**-------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ----------------------- | ----------- | ---------------------------- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාළව වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.207,280,181 ක් වූ තැන්පතු ශේෂ රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ පියවීමට හෝ කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි |

**2.3 අත්තිකාරම් ගිණුම් ශේෂ**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැඩ තහනම් කළ නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු,510,710 ක ණය ශේෂයයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනිමට කාර්යාලය අපොහොසත් වී තිබුණි. | ආයතන සංග්‍රහයේ **XXIV** පරිච්ඡේදයේ 4.5 වගන්තිය හා 4.6 වගන්තිය ප්‍රකාරව රජයට අයවිය යුතු මුදල් ප්‍රධාන ණයකරුගෙන් අයකර ගත නොහැකි අවස්ථාවල එම මුදල් ඔහුගේ ඇපකරුගෙන් අයකර ගත යුතු වීම. | නැවත සේවයේ පිහිටුවා ඇති නිලධාරීන්ගෙන් එම ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කරන බව හා එසේ නොමැති නම් ඇපකරුගේ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරන බවත්, විනය පරීක්ෂණයක් ඇති නිලධාරියාගෙන් ඉදිරියේදී එම ණය මුදල අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දැරණියගල හා ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විදාතා සම්පත් මධ්‍යස්ථානයන්හි ක්‍රියාකාරී සැලැසුම් අනුව පිළිවෙලින් වැඩසටහන් 57 ක් හා 43 ක් බැගින් ඉටුකිරීමට සැලැසුම් කර තිබුණද, වැඩසටහන් පිළිවෙලින් 42 ක් හා 22 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | සැලැසුම් කළ පරිදි අදාළ වැඩසහටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් සමහර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවන අතර ඊට අමතරව වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ ගංවතුර හා නායයෑම් හේතුවෙන් ආපදාවට පත් වූ කෑගල්ල දිස්ත්‍රික්කයේ මාර්ග 24 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් නියමිත දිනට ප්‍රතිසංස්කරණ කටයුතු නිම නොකිරීම නිසා රු.මිලියන 83.4 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | නියමිත ඉලක්කයන්ට ව්‍යාපෘති නිමකර සලසා තිබුණු ප්‍රතිපාදනවලින් ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2017 වර්ෂයේදී අවිච්ඡේද කරන ලද රු.මිලියන 83.4 ක වැඩවලින් 2018 වර්ෂයේදී නිමකරන ලද්දේ රු.මිලියන 19.71 ක වැඩ පමණි. ඉතිරි වැඩ සඳහා අක් මුදල් 2019 වර්ෂයේදී ලැබී තිබුණි. |

**3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

**------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කින් ජල ව්‍යාපෘති 07 ක් ඉටුකිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත රු.මිලියන 33.07 ක් වූ මුළු මුදලම නිදහස් කර තිබුණි. එම ව්‍යාපෘතිවල කටයුතු 2019 මාර්තු මාසය වන විටත් අවසන් කර නොතිබුණි. | මණ්ඩලය සමඟ සාකච්ඡා කර එම ව්‍යාපෘති කඩිනමින් ඉටුකරවා ගැනීමට පියවර ගතයුතු වීම. | මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ ජල සම්පාදන මණ්ඩලය සමඟ කිහිප අවස්ථාවකදී සාකච්ඡා කරනු ලැබූ බවත් හා එම ව්‍යාපෘති කඩිනමින් අවසන් කරන ලෙස උපදෙස් ලබාදුන් බව දක්වා ඇත. |
| (ආ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ආරම්භ කරන ලද කුඩා පරිමාණ ඇඟළුම් මධ්‍යස්ථාන 15 ක් අතරින් මධ්‍යස්ථාන 04 ක් අපේක්ෂිත මට්ටමින් | අලෙවිකරණය පිළිබඳ අවධානය යොමුකිරීම, චක්‍රලේඛ උපදෙස් වලට අනුගත වීම , කර්මාන්ත ශාලා සඳහා ලබාදී ඇති මූල්‍ය හා භෞතික සම්පත් පිළිබඳ සොයාබැලීම හා පසු විපරම් කටයුතු කළ යුතු වීම | 2018 දෙසැම්බර් 12 දින අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය නැවත සක්‍රීය කිරීමට උපදෙස් ලබාදෙන ලදී.<br>එම උපදෙස් වලට අනුව කටයුතු කිරීමට පවතින අපහසුතාවයක් ලෙස |

| | | |
|---|---|---|
| ක්‍රියාත්මක නොවන අතර මධ්‍යස්ථාන 11 ක් වසා දමා තිබුණි. | | යන්ත්‍ර උපකරණ රඳවා ඇති ගොඩනැගිලිවල හිමිකරුවන් විසින් ගොඩනැගිලි කුලිය මෙතෙක් ලබා නොදීම නිසා යන්ත්‍ර උපකරණ නිදහස් කර ගැනීමට නොදෙන බවට වාචිකව හා ලිඛිතව දන්වා ඇති බැවින් අදාළ ගොඩනැගිලිවලින් යන්ත්‍ර උපකරණ නිදහස් කර ගැනීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත.<br><br>මධ්‍යස්ථාන 05 ක උපකරණ තවදුරටත් එසේ පැවතීමෙන් සිදුවන රාජ්‍ය දේපල නාස්තිය පිළිබඳ සැලකිලිමත් වෙමින් අමාත්‍යාංශය විසින් එවන ලද 2018 සැප්තැම්බර් 14 දිනැති ලිපියේ උපදෙස් අනුව නව ප්‍රතිලාභීන් සඳහා එම යන්ත්‍රෝපකරණ භාරදී කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. |

**3.4** වාර්ෂික කාර්යසාධන වාර්තාව

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| පාරිභෝගික කටයුතු පිළිබඳ අංශය විසින් සැලැසුම් කර තිබූ වැටලීම් 150 ක්ද, දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය විසින් ක්‍රියාවට නැංවීමට සැලැසුම් කර තිබූ ව්‍යාපෘති 2 ක් සහ දිවිනැගුම අංශය මඟින් සැලැසුම් කර තිබූ ව්‍යාපෘති 05 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ඉලක්කයන්ට ලඟා වීමට කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි |

**3.5 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 මැයි මාසයේදී දිවයිනට බලපෑ ගංවතුර හා නායයෑම් හේතුවෙන් හානියට පත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ලබාදුන් ප්‍රතිපාදන වලින්, හානියට පත් නොවූ මාර්ග 09 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.38,027,134 ක ප්‍රතිපාදන උපයෝගී කර තිබූ අතර, 2017 දෙසැම්බර් මාසය වනවිටත් ඉන් රු.17,542,019 ක් වැය කර තිබුණි. | ඉලක්ක ගත ව්‍යාපෘතියට ප්‍රතිපාදන මුදල් යෙදවීමට කටයුතු කළ යුතු වීම. | 2017 වර්ෂයේ ගංවතුර හේතුවෙන් ආපදාවට ලක්වූ මාර්ග සබරගමුව පළාත් සභාවේ කෑගල්ල, රඹුක්කන සහ දෙහිඕවිට විධායක ඉංජිනේරුවන්ගේ නිර්දේශ සහිතව තෝරාගත් මාර්ග වන බව කාරුණිකව දන්වමි. |
| (ආ) | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේදී ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි නාපාවල පල්ලිය පාර පැති බැම්ම රු.1,325,709 ක් වැය කර එක් නිවාසයකට පමණක් ආරක්ෂාව සැලසෙන පරිදි ඉදිකර තිබුණි. ඉටුකරන ලද වැඩ ප්‍රමාණය හා ඇස්තමේන්තු ගත ප්‍රමාණය අතර විශාල වෙනස්කම් තිබුණද, ඒ සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | ව්‍යාපෘතියක් ඉටුකිරීම සඳහා නිසි අධීක්ෂණයක් සිදුකර ඇස්තමේන්තු සකස් කළ යුතු අතර, ඒ අනුව කටයුතු කළ යුතු වීම හා සිදු වී ඇති අවිධිමත්භාවය පිළිබඳ පරීක්ෂා කර ඉදිරි පියවර ගැනීම. | මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවත්වීම සඳහා මණ්ඩලයක් පත් කරන ලද අතර අදාළ වාර්තාව ලැබීමෙන් පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේදී ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි තිඹිරිපොල කනත්ත පාර පැති බැම්ම සහ බෝක්කුව ඉදිකිරීම සඳහා රු.1,939,616 ක වටිනාකමකට ගිවිසුම් ගත වී තිබුණි. ඉදිකළ පැති බැම්ම හා බෝක්කුවෙන් ඔබ්බට මාර්ගයක් නොතිබුණු අතර, බෝක්කුවෙන් ඔබ්බට පිහිටි | ව්‍යාපෘතියක් ඉටුකිරීම සඳහා නිසි අධීක්ෂණයක් සිදුකර ඇස්තමේන්තු සකස් කළ යුතු අතර, ඒ අනුව කටයුතු කළ යුතු වීම හා සිදු වී ඇති අවිධිමත් තත්ත්වය පිළිබඳ පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු පාර්ශවයට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගැනීම. | මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවත්වීම සඳහා මණ්ඩලයක් පත්කරන ලද අතර අදාළ වාර්තාව ලැබීමෙන් පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

කඳු කොටසින් ගලා එන ජලය මාර්ගය දිගේ ගලා ඒමෙන් දෙපස ඉවුරු ඛාදනය වී තිබුණි. ඇස්තමේන්තුව හා ඉටුකළ වැඩ කොටස් අතර විශාල වෙනස්කම් පැවති අතර ඒ සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි. ඇස්තමේන්තුවේ සඳහන් රු.142,697 ක වැඩ කොටස් ඉටු නොකර ඒ සඳහා ගෙවීම් කර තිබුණි.

**3.6 ප්‍රසම්පාදනයන්**

----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කළ එකතුව රු.31,931,288 ක වටිනා කොන්ත්‍රාත්තු 5 ක් සම්බන්ධයෙන් ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත ඇප තැන්පතු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. |

**3.7 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධ විද්‍යා සම්පත් මධ්‍යස්ථානයට 2005/2006 වර්ෂවලදී ලබාදී තිබුණු විජලන යන්ත්‍රය හා බේකරි උඳුන නිෂ්කාර්ය වී, දිරාපත් වෙමින් පැවතුණි. යතුරු පැදිය හා හිස් ආවරණ ,කොන්ක්‍රීට් උළුවහු රාමුව, කොන්ක්‍රීට් ජනෙල් රාමුව හා පුටු 4ක් දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | නිෂ්කාර්යව පැවැතු වත්කම් අළුත් වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට හෝ කටයුතු කළ යුතුවීම. | විද්‍යා සම්පත් මධ්‍යස්ථානයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තාව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි හැවනවලහේන වත්ත නැමැති ඉඩමේ පස් කපා අලෙවි කිරීමේ ස්ථානය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී ගිවිසුම් ප්‍රකාරව කොන්දේසි ඉටුකර නොතිබීම, ගිවිසුම් කොන්දේසි උල්ලංඝණය කර තිබීම, ප්‍රවේශ මාර්ගය දූවිලි රහිතව පවත්වා නොගැනීම, කැණීම් භූමිය තුළ එකතුවන ජලය ඉවත්කිරීම සඳහා කාණු පද්ධතියක් ඉදිනොකිරීම, කැණීම් බලපත්‍රයට අනුව ඉවත් කළ හැකි පස් කියුබ් ප්‍රමාණය පිළිබඳ සාක්ෂි නොතිබීම, පරිසර බලපත්‍රයේ කොන්දේසි ඉටු නොකිරීම, පස් කැණීමේදී යාබද ඉඩම් පිළිබඳ අවධානය යොමු නොකිරීමෙන් දැඩි අවධානම් තත්වයකට පත්ව තිබීම, ඉවුරු ස්ථාවර වීම සඳහා තෘණ භෝග වගාකර නොතිබීම සහ බලපත්‍ර ලබාදෙන හා අධීක්ෂණ කටයුතුවල මනා සම්බන්ධීකරණයක් නොතිබීම යන අඩුපාඩු අනාවරණය විය. | අඩුපාඩු සඳහා කොන්දේසි ඇතුළත් කර ගිවිසුම්වලට එළඹීම හා එම ගිවිසුම් ප්‍රකාර කටයුතු කිරීම කළ යුතු වීම. | අදාල ස්ථානයෙහි බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් පස් කැණීම් සිදුවන බව අනාවරණය වීමත් සමඟම, ඒ සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන රත්නපුර ප්‍රාදේශීය භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය අවස්ථා 2 කදී ලිපි 2 ක් මඟින් දැනුවත් කලද, ඒ සම්බන්ධයෙන් එම ආයතනය මඟින් කිසිඳු ක්‍රියාමාර්ගයක් නොගත් නිසා ඒ පිළිබඳ මගේ අංක BKP/EST/GRAVEL/D4/6 හා 2019 මාර්තු 01 දිනැති ලිපිය මඟින් භූවිද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයෙහි ප්‍රධාන කාර්යාලයෙහි අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කරන ලදී. ඉන් අනතුරුව දිස්ත්‍රික් පස් හා බොරළු කැණීම් කමිටුවද මේ පිළිබඳව දැනුවත් කිරීමෙන් පසු ඒ මඟින් භූවිද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වන ලදී. 2019 මාර්තු 15 දිනැති ලිපිය මඟින් මෙම බලපත්‍රය තාවකාලිකව අත්හිටුවීමට නියෝගය ලබා දී ඇත.<br><br>ඒ අනුව මේ වනවිට භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය මඟින් එම ස්ථානය පිළිබඳව ඒකාබද්ධ පරීක්ෂණයක් සිදුකොට ඇති අතර, එහි උල්ලංඝණය කර ඇති බලපත්‍ර කොන්දේසි නිවැරදි කර |

| | | | |
|---|---|---|---|
| | | | ඉදිරිපත් කරන තෙක් තාවකාලිකව මෙම බලපත්‍රය අත්හිටුවා ඇති බව වාර්තා කර තිබේ. |
| (ආ) | කැගල්ල දිස්ත්‍රික්කය තුළ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් ආරම්භ කර තිබූ ඉඩම් පවරා ගැනීමේ කාර්යයට අදාළ (අධිකරණ ක්‍රියාමාර්ගවලට අදාළ නොවන) ලිපිගොණු 60 ක කටයුතු අනවශ්‍ය ලෙස ප්‍රමාද කර තිබුණි. | අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළයුතු වීම. | ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ඉඩම් අමාත්‍යාංශය විසින් එක්ව සිදුකරනු ලබන ක්‍රියාවලියක් බැවින් ඒ අනුව සමහර වගන්ති ඉටුකිරිමට නිශ්චිත කාලයක් ගත වේ. එමෙන්ම ගැසට් පත්‍රය යවනු ලබන්නේ ඉල්ලුම්කාර අමාත්‍යාංශය විසිනි. මෙම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සංකීර්ණ කල් ගතවන ක්‍රියාවලියකි. කෙසේ වුවත් මේ පිළිබඳව පෞද්ගලිකව සොයා බලා ඉඩම් පනත අනුව පවරා ගැනීමේ කටයුතුවල ප්‍රමාදයන් වලක්වා ඇත. ඇතැම් ඉඩම් සඳහා නඩු පැවතීම , විරෝධතා මතුවීම ආදී හේතු ප්‍රමාදයට බලපා ඇත. |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් තුළ පිහිටි සබරගමුව පළාත් සභාවට අයත් අක්කර 105 රූඩ් 2 පර්චස් 12.5 ක් වූ භූමි ප්‍රමාණයකින් යුත් පාසල් ඉඩම් 65 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 25 ක් දක්වා අතර කාල පරාසයක් තුළ වසා තිබුණි. එයින් පාසල් 17 ක සම්පත් පමණක් වෙනත් කාර්යයන් සඳහා යොදවා ගෙන තිබුණි. ඉතිරි සම්පත් ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීම සඳහා කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම්වල හා ගොඩනැගිලිවල ආරක්ෂාව සම්බන්ධයෙන් විධිමත් පියවර ගෙන ඉඩම් ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීමට කටයුතු කළ යුතු වීම. | විවිධ හේතු නිසා දිස්ත්‍රික්කය තුළ පාසල් කිහිපයක් වැසී ගොස් ඇත. ප්‍රාදේශීය ලේකම් භාරයේ තිබෙන මෙම දේපල පොදු වැඩකට යෙදවිය යුතු වුවත්, ඒ සඳහා මෙතෙක් ඉල්ලීමක් ඉදිරිපත් වී නොමැති බව දන්වා ඇත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

.

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030 " හා 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එක් එක් අංශය මඟින් ක්‍රියාත්මක කළ යුතු අරමුණු, ඉලක්ක හා කාර්යසාධන දර්ශක නිශ්චිතව හඳුනාගෙන ඒවා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | අදාළ අරමුණු හා ඉලක්ක ක්‍රියාත්මක කිරීම පිළිබඳව අදාළ අංශ වෙත යොමු කළ යුතු වීම. | එක් එක් අංශය මඟින් ක්‍රියාත්මක කළ යුතු අරමුණු , ඉලක්ක හා දර්ශක සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති අඩුපාඩුකම් පිළිබඳව විගණනය විසින් කරුණු වශයෙන් පෙන්වා දෙන්නේ නම් ඉදිරියේදී වඩාත් නිවැරදිව ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීමට හැකිය. |

**5. යහපාලනය**

**මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දැරණියගල හා රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ආපදා හේතුවෙන් අධි අවධානමට පත් වූ පවුල් 32 ක් සඳහා ජල පහසුකම් ලබා දීමට කටයතු කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස් පරිදි ආපදාවට ලක්වූවන්ට යටිතල පහසුකම් සැලැස්විමට කටයුතු කළයුතු වීම. | අංහෙට්ටිගම තුන්මායිම වත්ත ඉඩමේ ජල ව්‍යාපෘතියක් සඳහා මේ වනවිට රු.4,742,797 ක දළ ඇස්තමේන්තුවක් සකස් කර ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා යොමු කර ඇති අතර ප්‍රතිපාදන ලද වහාම ජල පහසුකම් ලබා දීමට කටයුතු කරන බව දන්වමි. රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජල ව්‍යාපෘතියේ කටයුතු ජල සම්පාදන මණ්ඩලය විසින් සිදුකරමින් පවතී. |

6. **මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 නොවැම්බර් 02 දිනට නව කාර්යය මණ්ඩල වාර්තාව අනුව භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) තනතුර අනුමත වී තිබුණද, 2019 මාර්තු මාසය වනවිටත් එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එක් එක් අංශවල පුරප්පාඩු කළට වේලාවට පිරවීමට කටයුතු කළ යුතු වීම. | මෙහි සඳහන් තනතුරු පුරප්පාඩු පිළිබඳව මාසික සේවා සංඛ්‍යා වාර්තාවලින්ද ඊට අමතරව ලිඛිත ඉල්ලීම් මඟින් පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස අමාත්‍යාංශ ලේකම් වෙත වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |
| (ආ) රුවන්වැල්ල හා බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් සංවර්ධන නිලධාරින් තිදෙනෙකු බැගින් අනුයුක්ත කර තිබුණු අතර, ඔවුනට වැටුප් හා ගමන් වියදම් දීමනා ලෙස පිළිවෙලින් රු.1,019,241 ක් හා රු.1,334,296 ක් වර්ෂය තුළ ගෙවා තිබුණි. එහෙත් කෘෂි අංශයට අදාළ කටයුතු සඳහා ප්‍රතිපාදන සළසා නොතිබීම හේතුවෙන් ඊට අදාළ කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි | විශේෂිත කාර්යයන් සඳහා යොමු කළ නිලධාරීන්ට අදාළ වැඩ කටයුතු පැවරීමට කටයුතු කළ යුතු වීම. | අමාත්‍යාංශය විසින් නිශ්චිත රාජකාරී ලැයිස්තුවක් මෙම නිලධාරීන් වෙත ලබා දී නොමැති අතර වැඩසටහන් සංවිධානය කිරීම සඳහා ප්‍රතිපාදන ලබාදීමක් ද සිදුකර නොතිබුණි. |